# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2208/20 - 2020 දෙසැම්බර් මස 30වැනි බදාදා - 2020.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### දකුණු පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධානය) පනතේ 2(1)(අ) වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥපනතේ 247 වගන්තිය ප්‍රකාරව කරනු ලබන නියමයයි

දකුණු පළාත් ආණ්ඩුකාරවර විලියම් විජේසිංහ ගමගේ වන මා වෙත, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2(1)(අ) වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥ පනතේ 247 වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව තංගල්ල නගර සභාවේ සභාපති වෙදආරච්චි පටබැඳිගේ රවිඳු දිල්ශාන් වන ඔබට පහත පරිදි ක්‍රියා කරන ලෙස මෙයින් විධාන කරමි.

මා විසින් යොමු කරන ලද මාගේ අංක G/SP/4/7/16/4/7 හා 2020.12.13 දිනැති "තංගල්ල නගර සභාවේ 2021 වර්ෂය සඳහා අයවැය සභා සම්මත කර ගැනීම ව්‍යවස්ථානුකූලව සිදු නොකිරීම" ශීර්ෂගත කරුණට අදාළ ලිපියෙන් ඔබ වෙත ලබාදී ඇති උපදෙස් ප්‍රකාරව, ඔබ හෝ සභාව විසින් ක්‍රියා කරන තෙක් හෝ මා විසින් නැවත ගැසට් පත්‍රය මගින් නියමයක් කරන තෙක් හෝ 2021 ජනවාරි මස 01 වැනි දින සිට වහාම බලපැවැත්වෙන පරිදි ඔබ විසින් 2020.12.07 වැනි දින තංගල්ල නගර සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද 2021 වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් යෝජිත වියදම් පිළිබඳ ඇස්තමේන්තුවෙහි පුනරාවර්තන වියදම් සඳහා මුදල් වැය කිරීම පමණක් සිදු කරන ලෙසත්, කවර හෝ ප්‍රාග්ධන වියදමක් සඳහා මුදල් වැය කිරීම සිදු නොකරන ලෙසත් මෙයින් ඔබට විධාන කරමි.

ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ,
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2020 දෙසැම්බර් මස 30 වැනි දින,
දකුණු පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය,
පහළ ඩික්සන් පාර,
ගාල්ල.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 33259 — 30 (2020/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*